**පොල් සංවර්ධන අධිකාරිය - 2017**
**-------------------------------------**

පොල් සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරික්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පොල් සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

--------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 53 ඡේදය අනුව ප්‍රත්‍යාගණනය සිදු කල වත්කමක ධාරණ අගයේ අඩු වීමක් එම වත්කම් පන්තිය සම්බන්ධයෙන්ම වූ ප්‍රත්‍යාගණන අතිරික්තයට එරෙහිව ඍජුවම හර කල යුතු වුවද දුන්කන්නාව වත්තේ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් වූ රු. 8,673,540 ක ප්‍රත්‍යාගණන ඌණතාවය එම වත්කම් පන්තිය සම්බන්ධයෙන් වු ප්‍රත්‍යාගණන අතිරික්තයට එරෙහිව හර කිරීම වෙනුවට වර්ෂයේ ලාභයට එරෙහිව කපාහැර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබූ රු. 3,429,422 ක වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි පංකා, කාර්යාල ලී බඩු හා උපකරණ යටතේ දැක්වීම වෙනුවට ගොඩනැගිලි යටතේ දැක්වීම හේතුවෙන් ගොඩනැගිලි ශේෂය එම වටිනාකමින් හා ගොඩනැගිලි ක්ෂය රු. 489,185 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණි.

(ආ) පොල් පර්යේෂණ මණ්ඩලයට බදු දී නැවත අධිකාරිය වෙත 2016 වර්ෂයේදී පවරා ගෙන තිබූ "දුන්කන්නාව වත්තෙහි" කොහු මෝලට අයත් යන්ත්‍රෝපකරණ, පරිගණක හා කාර්යාල ලීබඩු හා උපකරණ අයිතම 164 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන සංචිත ගිණුම් ශේෂය රු.107,190,964 ක්වූ නමුත් මෝටර් වාහනවල 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණිත වටිනාකම වන රු.64,975,000 මුදල ප්‍රත්‍යාගණන සංචිතයේ අවසන් ශේෂය ලෙස ගලපා එහි වෙනස වන රු.42,215,964 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයට මාරු කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපනය විය.

(ඈ) කප්රුක ජය ඉසුරු ණය යෝජනා ක්‍රමයට අදාල සහන පොලී වියදම වූ රු.2,745,383 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂයට අදාල වියදමක් ලෙස ගිණුම් ගත නොකර ණයගැතියෙකු

ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට පොලී වියදම හා සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 අවිනිශ්චිත ගිණුම්

--------------------

මූල්‍ය ප්‍රකාශන වල 2016 වර්ෂයේ සිට පවතින රු. 1,871,776 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයන් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | ----------------- | ------------- | --------------- |
| (i). | දිසිදි පොල් මෝල් හිමියන්ට සපයා ඇති සේවාවන් වෙනුවෙන් (Service Rendered to D.C. Millers) මුදල් ලැබීම් | 2,000,913 | ලදුපත් |
| (ii). | ණයට විකුණුම් | 3,136,537 | ඉන්වොයිස් |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) සෙස් අරමුදල යටතේ පවතින ණය ගැතියන්ගෙන් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට පවතින රු. 180,485 ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි

(ආ) පෞද්ගලික සමාගමක් වෙත 1984, 2002 සහ 2004 වර්ෂ වලදී ලබා දී තිබූ ණය මුදලෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.31,550,000 ක් අය විය යුතුව පැවතුණි. ණය මුදලට අදාල පොලිය වූ රු.40,116,090 ක ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.140,413,563 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.96,418,633 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 43,994,930 ක වර්ධනයක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව රජයේ ආදායම රු.14,310,017 කින් අඩු වුවද වෙනත් ආදායම් රු.133,833,931 කින් වැඩි වීම සහ සේවක පාරිශ්‍රමික වියදම රු.20,020,168 කින් හා පුහුණු හා සංවර්ධන වියදම් රු.29,292,265 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.36,419,413 ක්වූ අතිරික්තය 2014 වර්ෂය වනවිට රු.15,457,175 ක් දක්වා පිරිහී තිබුණද 2017 වර්ෂය වනවිට රු.140,413,563 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු 118,356,413 වූ දායකත්වය 2014 වර්ෂයේදී රු.116,614,175 දක්වා පිරිහී තිබුණද 2015 වර්ෂයේ සිට විචලනයන් සහිතව සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.309,001,563 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මුළු ආදායමෙන් සියයට 39 ක් භාණ්ඩාගාර ප්‍රදාන වලින් සමන්විත වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සැසදීමේදි සමාලෝචිත වර්ෂයේ දී වෙනත් ආදායම් සියයට 70 කින් ඉහල ගොස් තිබුණු අතර පොලී ආදායම, රසායනාගාර ආදායම, පරීක්ෂණ හා සැකසුම් ගාස්තු ඉහල යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සැසදීමේ දි සමාලෝචිත වර්ෂයේ දී ජංගම අනුපාතය 1:18 සිට 1: 8 දක්වා පහල ගොස් තිබුණි.

## 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ නිලධාරියෙකු විසින් සමාලෝචිත වර්ෂයේදී රැකියාවේ උසස් වීමක් පිළිබඳව මූලික අයිතිවාසිකම් කඩ වීම සම්බන්ධයෙන් අධිකාරියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

(ආ) අධිකාරියේ හිටපු ගණකාධිකාරිවරයෙකු සිදුකර තිබූ මුදල් වංචාවට අදාලව රු.2,000,000 ක් සඳහා මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින අතර රු.1,300,000 කට අදාලව වංචා විමර්ශන කාර්යාංශය විසින් පරීක්ෂණ සිදු කරමින් පැවතුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ව්‍යාපෘති ඒකකයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබූ තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථාන 5 ක් පිහිටුවීමට සහය වීම හා ගුණාත්මක නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය උපකරණ 300 ක් ලබා ගැනීමට සහ නිෂ්පාදන දත්ත ලබා ගැනීම හා ලබාදීමට දත්ත පද්ධතියක්

සැකසීම අරමුණුකර රු. මිලියන 5.3 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ එකී ක්‍රියාකාරකම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පොල් ත්‍රිකෝණයෙන් බැහැර පොල් ආශ්‍රිත අගය වැඩිකළ නිෂ්පාදන සිදුකර ලීමට සහය වීම වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 3.5 ක් වෙන් කර තිබුණද, එයින් උපයෝජනය කර තිබුණේ රු. මිලියන 0.54 ක් පමණක් විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් කිරි, පොල් කිරිපිටි, පොල් ක්‍රීම් පාරිභෝගික ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් වැඩසටහන් ප්‍රචාරය කරවා ගැනීම වෙනුවෙන් අධිකාරිය විසින් 2014 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට හා රූපවාහිනී සංස්ථාවට ගෙවා තිබූ මුදලින් ප්‍රචාරණය නොවූ වැඩසටහන් වෙනුවෙන් එකී ආයතනවලින් පිළිවෙලින් රු.136,970 ක් හා රු.7,060,032 අයවිය යුතු වුවද එකී මුදල් අයකර ගැනීමට හෝ ඒ වෙනුවෙන් වෙනත් වැඩසටහන් ප්‍රචාරය කරවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නොහැකි වී තිබුණි.

(ආ) ආයතනයේ කාර්යමණ්ඩලයට අදාලව සෑත්කම් හා රෝහල් රක්ෂණාවරණයට අදාල ප්‍රසම්පාදන කටයුතු මාස 2 දින 19 ක් ප්‍රමාද වීම හේතුවෙන් එම කාලය තුල නිලධාරීන්ගේ නේවාසික ප්‍රතිකාර ලබා ගැනීම් සහ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 293,677 ක් හා රු. 308,823 ක් අධිකාරිය විසින් ගෙවීමට සිදුව තිබුණි.

(ඇ) ශ්‍රී ලාංකිය පොල් නිෂ්පාදනය අපනයනය කිරීමේ Ceylon Coconut සන්නාම නාමය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන තුරු අධිකාරියට නොහැකි වී තිබුණි.

### 4.3 කාර්යමණ්ඩල පරිපාලනය

----------------------------

සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරියේ කාර්යය මණ්ඩලයෙහි අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන), අධ්‍යක්ෂ අලෙවිකරණ (ජාත්‍යන්තර), නීති නිලධාරි, තත්ව පාලන නිලධාරි යන තනතුරු වල පුරප්පාඩු පැවතියද අදාල තනතුරු වලට සුදුසුකම්ලත් නිලධාරීන් පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

----------------------

### 5.1. තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම

--------------------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති එන්පී/එස්පී/එස්ඩීජී/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව පොල් සංවර්ධන අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. ඊට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළගා වීම සඳහා අධිකාරිය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට අතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවැතීම අත්‍යාවශ්‍ය වුවත්, අධිකාරිය විසිත් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

රසායනාගාරය නවීකරණය කිරිමේ කටයුතු සඳහා 2017 සැප්තැම්බර් 25 දින කොන්ත්‍රාත්කරුවෙකු සමග එළඹ තිබූ රු.17,105,455 ක ගිවිසුම අනුව අදාල ඉදිකිරීම් 2017 දෙසැම්බර් 25 වනවිට අවසන් විය යුතු වුවත් විගණන දිනය වූ 2018 ජූලි 30 වන විටත් අදාල ඉදිකිරීම් නිමකර නොතිබුණි. ඒ හේතුවෙන් 2017 වර්ෂයේදී මිලදී ගත් රු. 17,950,802 ක රසායනාගාර උපකරණද අදාල අරමුණු වලට යොදාගැනීමට නොහැකි වී තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩු පාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ස්ථාවර වත්කම් නිවැරදි ලෙස වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම.<br>ii. ජ'නල් සටහන් මඟින් ගැලපීම් සිදු කිරීමේ දී වගකිව යුතු නිලධාරින්ගේ නිර්දේශය අනුව සිදු නොකිරීම. |
| (ආ) මානව සම්පත් කළමනාකරණය | ප්‍රධාන තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා අවශ්‍ය බඳවා ගැනීම් කටයුතු සිදු නොකිරීම. |
| (ඇ) අයවැය පාලනය | අයවැයගත මුදල් අදාල අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් යොදාගෙන නොතිබීම. |
| (ඇ) වත්කම් කළමණාකරනය | කොටුව ආදිපාද වීදියේ කාර්යාල ගොඩනැගිල්ලේ ඇති වූ ගිනි හානිය සම්බන්ධයෙන් වූ වාර්තාව ලබාදීමේ ප්‍රමාදයක් පැවතීම හා නියෝගයක් ලබා නොගෙන පිරිවැය රු. 3,312,462 ක කාර්යාල උපකරණ හා පරිගණක උපාංග පොත් වලින් ඉවත් කර තිබීම. |